SL018

NARA

# ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

# தேசிய நீரியல்வள முகாமை

# NATIONAL AQUATIC RESOURCES AGENCY

# 1985

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## ஆண்டறிக்கையும் கணக்கும்

A-004

## ANNUAL REPORT AND ACCOUNTS

පිටපතකි.

මගේ අංකය: එල්අයි/පී/එන්ඊආර්ඩී/86

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.

1987 නොවැම්බර් 17 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා
සංවර්ධන නියෝජිතායතනය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ
1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්
පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය
ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

=================================================

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත්කළ යුතු යයි ම විසින් අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තර වාර්තාවක් 1987 අගෝස්තු 27 දින සභාපතිවරයා වෙත යවන ලදී.

## 1:2 විගණන විෂය පථය.

මෙම වාර්තාවේ අඩංගු විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචන සහ ප්‍රමාණවත් ගණුදෙනු නියැදි පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචන සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, සම්පත් සහ කාලවේලාව යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපතිට අභිමතානුසාරී බලතල පැවරේ.

/2....

## 2. ගිණුම්

### 2:1 විගණන මතය.

මෙම වාර්තාවේ පහත සඳහන් ඡේදයන් යටතේ ඇතුලත් කර ඇති අදහස් දැක්වීම් අනුව 1986 දෙසැම්බර් මස 31 දිනට ඉදිරිපත් කරන ලද ගිණුම් පිළිබඳව මතයක් මා හට ප්‍රකාශ කළ නොහැකිය.

| අඩුපාඩු | මෙම වාර්තාවේ ඡේදයන්ට යොමුව. |
|---|---|
| I ගිණුම් ප්‍රතිපත්තිය | 2:5:1 |
| II ගිණුම් වලින් අත්හැරීම් | 2:5:2 |
| III අනුචිත හෙළි කිරීම් | 2:5:3 |
| IV විගණනය සඳහා සාක්ෂි | 2:5:4 |
| V නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ නිරණයන්ට අනුකූල නොවීම | 2:5:5 |
| VI හඳුනාගත් පාඩු | 2:5:6 |
| VII මූල්‍ය සීමිකම් | 2:5:7 |

### 2:2 මූල්‍ය ප්‍රතිඵල.

ගිණුම් වලට අනුව 1988 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජිතායතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.45,38,360 ක ආදායම ඉක්මවූ වියදම් අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ වියදම් අතිරික්තය රු. 19,74,832 ක් විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 1986 | | 1985 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | | | |
| රජයේ ආයකය | 85,00,000 | | 71,25,000 | |
| විවිධ ආදායම් | 42,123 | 85,42,123 | 2,62,932 | 73,87,932 |
| **අඩුකලා:** | | | | |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පරිපාලන වියදම් | 1,08,06,877 | | 75,28,089 | |
| ආයතන වියදම් | 22,73,606 | 1,30,80,483 | 18,34,675 | 93,62,764 |
| ආදායම් අතිරික්තය(ඌණතාවය) | | (45,38,360 | | (19,74,832) |

2:3 **මූල්‍ය ව්‍යුහය:**

1986 දෙසැම්බර් 11 දිනට නියෝජිතායතනයේ මූල්‍ය ව්‍යුහය 1988 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සමඟ සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | 1985 | 1986 |
| | රු. | රු. |
| **සම්පත්** | | |
| රජයේ දායකය | 2,38,70,080 | 1,92,51,000 |
| විදේශාධාර | 40,53,818 | 22,62,998 |
| | 2,79,23,898 | 2,15,13,998 |
| ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය | (19,90,138) | 24,38,099 |
| | 2,59,33,760 | 2,39,52,097 |

| | 1985 | 1986 |
|---|---|---|
| **උපයෝජනය:** | | |
| අඩුකළ වටිනාකමට ස්ථාවර වත්කම් | 2,60,53,334 | 2,29,92,768 |
| ශුද්ධ ජංගම වත්කම් | ( 1,19,574) | 9,59,329 |
| | 2,59,33,760 | 2,39,52,097 |

/ 4.....

## 2:4 අරමුදල් ප්‍රභවය සහ යෙදවීම

සමාලෝචිත වර්ෂය තුලදී නියෝජිතායතනයේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම පහත ප්‍රකාරයෙන් දැක්වේ.

| අරමුදල් ප්‍රභවය: | රු. | රු. | රු. |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ දායකය | | 46,19,080 | |
| විදේශාධාර | | 17,90,820 | 64,09,900 |
| **අරමුදල් යෙදවීම** | | | |
| ශුද්ධ ඌනතාවය | 45,38,360 | | |
| අඩුකලා: ස්ථාවර වත්කම් සඳහා ක්ෂයවීම් | 16,38,715 | | |
| | 28,99,645 | | |
| අඩුකලා: පසුගිය වර්ෂයට අදාල ගැලපීම් | 1,10,123 | 27,89,522 | |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | | 46,99,280 | 74,88,802 |
| කාරක ප්‍රාග්ධනයේ අඩුවීම | | | (10,78,902) |

| | කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම | | |
|---|---|---|---|
| | අඩුවීම | වැඩිවීම | |
| | රු. | රු. | |
| විවිධ ණය ගැතියෝ | - | 2,64,973 | |
| තැන්පතු | 350 | - | |
| අත්තිකාරම් | 1,92,415 | - | |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 19,159 | - | |
| අත ඉතිරි හා බැංකුවේ මුදල් | 14,52,581 | - | |
| ණය හිමියෝ හා උපචිත වියදම් | 1,01,054 | - | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | - | 4,21,684 | |
| | 17,65,559 | 6,86,657 | 10,78,902 |

## 2:5 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්.

### 2:5:1 ගිණුම් ප්‍රතිපත්තිය:

නියෝජිතායතනය විසින් අනුමත කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය ගිණුම් වලින් අනාවරණය කර නොමැත. විගණන සෝදිසි වලදී මතු දැක්වෙන නිරීක්ෂණයන් හෙළිවිය.

I. පසුගිය වර්ෂ වල කරන ලද අයභාර ස්වභාවයේ රු. 85,78,402 ක වියදම ප්‍රාග්ධනික කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. උදා: මාළු බෝකිරීමේ ටැංකි සඳහා වියදම.

II. විදේශාධාර සහ වෙනත් ප්‍රදානයන් තැන්පත් ගිණුම් වල ජංගම වගයෙන් දක්වා තිබුණි. උදා: එක්සත් ජාතීන්ගේ පාරිසර ව්‍යාපෘතියෙන් ලැබුණු ආධාර සහ ප්‍රධාන කාර්යාල භූමියෙහි මත්ස්‍ය පොකුණක් සඳහා ආධාර.

### 2:5:2: ගිණුම් වලින් අත්හැරීම්:

පහත සඳහන් විෂයයන් ගිණුම් ගත කර නොතිබුණි.

| | විෂය | වටිනාකම | විස්තර |
|---|---|---|---|
| (අ) | සමුද්‍රමාරූ නෞකාව | වටිනාකම නිර්ණය කර නැත. | 1985 වර්ෂයේදී ධීවර අමාත්‍යාංශය විසින් නියෝජිතායතනයට භාරදෙන ලද පර්යේෂණ කටයුතු සඳහා යොදා ගන්නා සමුද්‍රමාරූ නෞකාවේ වටිනාකම ගිණුම් ගත කර නොමැත. |
| (ආ) | නියෝජිතායතනය භාරයේ ඇති අමාත්‍යාංශය සතු වත්කම් | -එම- | කලින් ධීවර අමාත්‍යාංශය සතුව තිබූ දැනට නියෝජිතායතනය භාරයේ ඇති චංචල හා නිශ්චල දේපල 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය පනතේ 35 වගන්තිය ප්‍රකාරව නියෝජිතායතනය වෙත පවරා ගෙන අගය කොට ගිණුම්වල දක්වා නොතිබුණි. |
| (ඇ) | පාරිභෝජ්‍ය හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ. | නිර්ණය කර නැත. | නියෝජිතායතනයේ ගබඩාවක් තුල 1986 දෙසැම්බර් 31 දිනට තිබූ පාරිභෝජ්‍ය හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ තොග වටිනාකම ගණනය කර ගිණුම් ගත කොට නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | විදුලිය ගාස්තු | රු. 77,198 | සමාලෝචිත වර්ෂයට අදාලවූ ශ්‍රී ලංකා ධීවර අභ්‍යාස ආයතනයේ විදුලි බිල්පත් වෙනුවෙන් නියෝජිතායතනය විසින් ගෙවා තිබූ මෙම මුදලට අදාලව ගිණුම් වල ගැලපීම් කර නොතිබිණ. |
| (ඉ) | ධීවර අමාත්‍යාංශයෙන් අනුයුක්ත කල නිලධාරීන් | රු. 21,521 | ධීවර අමාත්‍යාංශය විසින් නියෝජිතායතයට අනුයුක්ත කරනලද නිලධාරීන් දෙදෙනෙකුගේ රු.21,521 ක් වන පාරිශ්‍රමික ගිණුම් වල දක්වා නොතිබුණි. |

## 2:5:3 අනුචිත හෙළි කිරීම්

පහත සඳහන් අනුචිත හෙළි කිරීම් ගිණුම්වල දක්නා ලදී.

| | විෂය | වටිනාකම | කිවයුතු දේ |
|---|---|---|---|
| (අ) | වෙනත් | රු. 9,430 | ලිපිගොනු කැබිනට් සහ වානේ අල්මාරි වෙනුවෙන් දරන ලද මෙම වියදම කාර්යාල උපකරණ ලෙස දක්වා නෙ මැත. |
| (ආ) | -එම- | රු. 34,853 | ගොඩනැගිලි නඩත්තු කිරීම වෙනුවෙන් දරන ලද මෙම වියදම ශේෂ පත්‍රයෙහි වෙනත් ස්ථාවර වත්කම් වශයෙන් දක්වා ඇත. |
| (ඇ) | වෙනත් | රු. 16,254 | පර්යේෂණ නෞකාවට ඩීසල් සැපයීම වෙනුවෙන් දරන ලද මෙම වියදම ශේෂ පත්‍රයෙහි වෙනත් වත්කම් යටතේ දක්වා ඇත. |
| (ඈ) | වාහන බලපත්‍ර ගාස්තු | රු. 5,300 | 1987 වර්ෂයේ බලපත්‍ර ගාස්තු සඳහා 1986 වර්ෂයේදී ගෙවනලද මුදල 1986 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. |

**2:5:4 විගණනය සඳහා සාක්ෂි:**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම විෂයයන් පිළිබඳ විගණනයේදී සතුටුදායක සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | ගිණුම | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 2,96,64,828 | I. ස්ථාවර වත්කම් උපලේඛන<br>II. වර්ෂය අවසානයේදී හෝ වර්ෂය තුල වත්කම් සත්‍යාපනය කල බවට සාධක. |
| (ආ) | විවිධ ණය ගැතියෝ | 3,00,277 | ඒවල ණයගැති ගිණුම් සහ අදාල පාර්ශවයන්ගේ සනාථ කිරීම්. |
| (ඇ) | නියෝජිතායතනය විසින් තැන්පත් කිරීම | 3,21,144 | ඒවල තැන්පත් ගිණුම් සහ අදාල පාර්ශවයන්ගෙන් සනාථ කිරීම්. |
| (ඈ) | ණය හිමියන් සහ උපචිත වියදම් | 6,14,203 | ඒවල ණයහිමි සහ උපචිත වියදම් ගිණුම් සහ අදාල පාර්ශවයන්ගෙන් සනාථ කිරීම්. |
| (ඉ) | නියෝජිතායතනය වෙත තැන්පත් | 11,34,668 | -එම- |

2:5:5

**2:5:5 නීතිරීති, රෙගුලාසි සහ කලමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම.**

විගණනයේදී නිරීක්ෂණය කරන ලද නීතිරීති ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීතියට යොමුව | අවශ්‍යතාවය | පිළිනොපැදීම පිළිබඳ විස්තර. |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරණ මුදල් පනත 13(5) (ඩී) වගන්තිය. | විගණකාධිපති වරයා වෙත එකඟව අවට අභ්‍යන්තර විගණන වැඩ සටහන් ආයතනය විසින් නිර්ණය කල යුතුය. | අභ්‍යන්තර විගණන වැඩ සටහන් ඉදිරිපත් කර නැත. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනත 13(බී) වගන්තිය | ගිණුම් වර්ෂයන් අවසානයට පසු එම වර්ෂයේ අප්‍රියෙල් 30 දින හෝ ඊට පෙර වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු අතර, විගණකාධිපති විසින් නියම කරනු ලබන ආකාරයට එම ගිණුම් පිළිබඳ වාර්තාවක්ද ගිණුම් සමග ඉදිරිපත් කල යුතුය. | 1986 වර්ෂය සඳහා ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 1987 ජූනි 09 දිනදීය. තොග සහ ගබඩා භාණ්ඩ පිළිබඳ ඉදිරිපත් කල යුතු යයි විගණකාධිපති විසින් නියම කර ඇති වාර්තා ද ඉදිරිපත් කර නොතිබිණ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනත 14(1) වගන්තිය. | ගිණුම් වර්ෂය අවසානවී මාස 4 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. | 1986 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් 1987.09.10 දින වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබින. |
| (ඈ) | 1971 අංක 38 දරන මුදල් පනත 14(3) වගන්තිය | නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව මුදල් වර්ෂයක් අවසන්වී මාස 10 ක් ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කල යුතුය. | නියෝජිතායතනය ආරම්භ කල 1981 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබින. |
| (ඉ) | ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය මූල්‍ය කාර්ය පරිපාටිය. | මුදල් වර්ෂය අවසන්වීමට පෙර වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් පැවැත්විය යුතුය. | 1986 වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් පවත්වා නොතිබිණ. |
| (ඊ) | ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය මූල්‍ය කාර්ය පරිපාටිය. | වැටුප් සහ අත්තිකාරම් ගෙවීම් කිරීමට නියමිත දිනයෙන් පසු එළඹෙන තුන්වන දිනයේදී හිමිකම් පා නොමැති වැටුප් හා අත්තිකාරම් ලේඛණයට මාරුකොට බැංකුගත කල යුතුය. | සමාලෝචිත වර්ෂය තුලදී හිමිකම් පා නොමැති වැටුප් හා අත්තිකාරම් සමහර අවස්ථාවලදී දින 10 කට වඩා මුදල් අයකැමි භාරයේ රඳවා ගෙන තිබුනි. |
| (උ) | මුදල් රෙගුලාසි අංක 396(ඩී) | මාස 6 කට වැඩි කලක් පරිශේෂව පැවති චෙක්පත් වටිනාකම නිශ්කාශනය කිරීම හෝ ආදායමට ගැනීම කල යුතුය. | රු.10,538 ක් සඳහා චෙක්පත් නිශ්කාශනය කිරීම පිළිබඳව කටයුතු කර නොතිබුනි. |

2:5:6 <u>හඳුනාගත් පාඩු:</u>

1986 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් සටහන් කාර්ය මණ්ඩල ණය ගැතියන් වශයෙන් පෙන්නුම් කර ඇති රු.2,74,158 ක් වූ මුදලෙහි නියෝජිතායතනයේ සේවය හැරගිය සේවකයන් 6 දෙනෙකුගෙන් අයකර ගත යුතු එකතුව රු.13,127 ක් වූ සුලු මුදල් අග්‍රිම ඇතුලත් විය. මෙම අග්‍රිමයෙන් 1987 ඔක්තෝම්බර් වන විට අයවීමට ඇති මුදල රු.8832/- කි.
ආපසු අයකර ගැනීම අනුමත මෙම මුදල වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන කිසිවක් සලසා නොමැත.

2:5:7 <u>මූල්‍ය හිමිකම්:</u>

සැපයුම්කරුවන් වෙත භාණ්ඩ හා සේවා සැපයීම් සඳහා වර්ෂ තුනකට පෙර ලබාදී තිබූ රු.1,26,859 ක් වූ අත්තිකාරම් 1986 දෙසැම්බර් 31 දින වන විටත් බේරුම් කර නොතිබිනි. මෙම අත්තිකාරම් මුදල් අයකෙරෙමින් පවත්නා අතර 1987 ඔක්තෝම්බර් මස වන විට අයවීමට තිබූ හිඟ මුදල රු.61,190 කි.

## 3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 3:1 මූල්‍ය ප්‍රතිඵල

ගිණුම් වලට අනුව 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජිතායතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.45,38,360 ක ශුද්ධ මෙහෙයුම් ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ මෙහෙයුම් ඌනතාවය රු. 19,74,832 ක් විය. වර්ෂය සඳහා වූ ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ නියෝජිතායතනයේ වැඩ කටයුතු ව්‍යාප්ති කිරීම නිසා පරිපාලන හා ආයතන වියදම් ඉකුත් වර්ෂයට වඩා රු.37,17,719 කින් වැඩිවීමයි.

### 3:2 අයවැය පාලනය:

සමාලෝචිත වර්ෂය සඳහා අදාල අයවැය ලේඛනගත වියදම සහ සත්‍ය වියදම් පිළිබඳ විචලනයන් විස්තරාත්මකව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ). ප්‍රකාර නියෝජිතායතනය වෙත ඉදිරිපත් කල මාගේ වාර්තාවේ සඳහන් කරන ලදී. එහි සඳහන් වැදගත්වන විචලනයන් කිහිපයක් පහත දක්වා ඇත.

| | වියදම් විෂයය | අයවැය ලේඛනය | සත්‍ය | විචලනය ප්‍රතිශත වශයෙන් |
|---|---|---|---|---|
| 1. | වැටුප් හා වේතන | 40,90,000 | 51,03,237 | 25% |
| 2. | අතිකාල | 1,60,000 | 2,84,071 | 78% |
| 3. | ගමන්ගමන | 6,00,000 | 8,58,185 | 43% |
| 4. | වාහන හා උපකරණ ආදිය නඩත්තුව | 8,00,000 | 18,05,508 | 126% |
| 5. | දුරකථන | 60,000 | 1,22,918 | 103% |
| 6. | විවිධ වියදම් | 2,25,000 | 7,58,406 | 237 % |
| 7. | ලිපි ද්‍රව්‍ය | 1,[illegible] | 3,[illegible],673 | 10[illegible] |
| 8. | ප්‍රචාරණය | 50,000 | 63,628 | 27% |
| 9. | ආරක්ෂිත උපකරණ | 25,000 | 49,900 | 100% |

ඉහත සඳහන් තොරතුරු අනුව බලතල සමාලෝචිත වර්ෂය තුලදී සතුටුදායක අයවැය පාලනයක් පැවති බවට සෑහීමට පත්විය නොහැක.

/....10

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්හි අඩුපාඩු මාගේ සවිස්තර වාර්තාවේ ඇතුලත් කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) මුදල්

(ආ) සුළු මුදල් ගෙවීම් සඳහා කාර්ය මණ්ඩලයට අත්තිකාරම්

(ඇ) මිලට ගැනීම්

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) විදේශාධාර සහ ප්‍රදාන සඳහා ගිණුම් තැබීම

(ඊ) අයවැය පාලනය

අ.ක./පැහැදිලි නැත
විගණකාධිපති

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

## 1986 සැප්තැම්බර් 31 දින පැවැති අයුරු ශේෂ පත්‍රය

| 1985 | | 1986 |
|---|---|---|
| | **රජයේ දායක මුදල** | |
| 34,402,438.29 | ගතවූ වර්ෂයේ ශේ/ප පරිදි ඉදිරියට ගෙනඑනලද ශේෂය | 47,423,998.65 |
| 11,195,000.00 | 1986වර්ෂය සඳහා ලැබුණු ආධාර දීමනා | 13,119,080.00 |
| 1,826,560.36 | 1986 වර්ෂය සඳහා විදේශ ආධාර | 1,790,820.15 |
| 47,423,998.65 | මුළු දායක මුදල | 62,333,898.80 |
| 14,525,184.77 | ගතවූ වර්ෂයේ ශේ/ප පරිදි පුනරාවර්තන වියදම | 23,887,949.08 |
| 9,362,764.31 | වර්ෂයතුල පුනරාවර්තන වියදම | 13,080,483.98 |
| 23,887,949.08 | මුළු පුනරාවර්තන වියදම | 36,968,433.06 |
| | **යොදවන ලද දායක මුදල** | |
| 20,030,369.82 | ගතවූ වර්ෂයේ ශේ/ප පරිදි ඉදිරියට ගෙනෙන ලද ශේෂය | 23,9520097.98 |
| 4,070,000.00 | වර්ෂය සඳහා ආධාර දීමනා | 4,619,080.00 |
| 1,826,560.36 | වර්ෂය සඳහා විදේශ ආධාර | 1,790,820.15 |
| 25,926,930.18 | | 30,361,998.13 |
| (1,974,832.20) | ආදායමට වැඩි වියදම් අතිරික්තය | (4,428,237.20) |
| 23,952,097.98 | | 25,933,760.93 |

## දායක මුදල යෙදවුම්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | **ස්ථිර වත්කම්** | | | | |
| 10,303,092.59 | 1,372,411.07 | 8,930,681.52 | | ගොඩනැගිලි | 10,925,363.15 | 2,402,720.32 | 8,522,642.83 | |
| 1,320,722.13 | 192,572.07 | 1,128,150.06 | | යන්ත්‍රෝපකරණ | 1,640,280.74 | 324,644.28 | 1,315,636.46 | |
| 3,334,348.19 | 171,056.47 | 3,163,291.72 | | උපකරණ | 4,628,474.26 | 504,491.28 | 4,123,982.98 | |
| 37[illegible],966.00 | 58,902.07 | 318,063.93 | | ලීබඩු | 481,445.50 | 96,598.67 | 384,846.83 | |
| 398,154.23 | 40,526.60 | 357,627.63 | | පුස්තකාල පොත් හා සඟරා | 433,802.23 | 80,342.02 | 353,460.21 | |
| 653,863.09 | 137,311.23 | 516,551.06 | | වාහන | 2,217,257.34 | 202,697.53 | 2,014,559.81 | |
| 715,630.73 | - | [illegible]0.73 | | විවිධ | 715,630.73 | - | 715,630.73 | |
| - | - | - | | වෙනත් | 759,802.50 | - | 759,802.50 | |
| 1,019,506.38 | - | 1,019,506.38 | | ගමන් වියදම් | 1,019,506.38 | - | 1,019,506.38 | |
| 906,761.57 | - | 906,761.57 | | ඉන්ධන | 906,761.57 | - | 906,761.57 | |
| 2,920,065.99 | - | 2,920,065.99 | | විදුරු බඩු හා පාරිභෝජ්‍යය | 2,920,065.99 | - | 2,920,065.99 | |
| 3,016,437.40 | - | 3,016,437.40 | | වැටුප් හා දීමනා | 3,016,437.40 | - | 3,016,437.40 | |
| 24,965,548.30 | 1,972,779.51 | 22,992,768.79 | 24,965,548.30 | | 29,664,827.79 | 2,611,494.10 | 26,053,333.69 | 29,664,827 |
| | | | | **ප්‍රවර්තන වත්කම්** | | | | |
| 133,708.43 | | | | විවිධ ණයකරුවෝ (ද.1) | 398,681.43 | | | |
| 142,015.00 | | | | තැන්පතු (ද.2) | 141,665.00 | | | |
| 513,558.29 | | | | අත්තිකාරම් (ද.3) | 321,143.99 | | | |
| 293,317.33 | | | | ණයකරු සේවකයන් (ද.4) | 274,158.25 | | | |
| 1,946,230.84 | 3,028,829.89 | | | බැංකුව හා මුදල් (ද. | 493,649.10 | 1,629,297.77 | | |
| | | | | **ප්‍රවර්තන වගකීම්** | | | | |
| 513,148.19 | | | | ණය හිමියෝ හා එකතුවූ වියදම් (ද.5) | 614,202.82 | | | |
| 1,556,352.51 | | | | තැන්පතු (ද.6) | 1,134,667.71 | | | |
| 1,972,779.51 | 4,042,280.21 | | (1,013,450.32) | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනය (ද.7) | 2,611,494.10 | 5,360,364.63 | | (3,731,066. |
| | | | 23,952,097.98 | | | | | 25,933,76[illegible] |

අත්සන් කළේ/
(ආචාර්ය හිරාන් ඩබ්. ජයවර්ධන)
සභාපති

1987 මැයි 29

අත්සන් කළේ/
(ආචාර්ය පී.ස.එන්. ජයසූරිය)
අධ්‍යක්ෂ ජනරාල්

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

### 1986 දෙසැම්බර් 31 දිනින් අවසන්වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම

| 1985 | | | 1986 | |
|---|---|---|---|---|
| | 7,125,000.00 | රජයේ දායක මුදල | | 8,500,000.00 |
| | 262,932.11 | විවිධ ආදායම | | 42,123.40 |
| | 7,387,932.11 | | | 8,542,123.40 |
| | | **පුනරාවර්තන වියදම්** | | |
| | | **පරිපාලන වියදම්** | | |
| 3,003,128.25 | | වැටුප් | 2,635,959.22 | |
| 1,255,972.49 | | දීමනා | 1,467,276.51 | |
| 322,579.30 | | සේවක අර්ථසාධක අරමුදල හා සේ.අ. | 353,438.93 | |
| 210,801.92 | | අතිකාල | 284,070.83 | |
| 179,683.07 | | ගමන් වියදම් | 550,927.98 | |
| 346,594.98 | | ආරක්ෂක සේවාවන් | 307,497.89 | |
| 44,778.50 | | ගාස්තු | 33,549.00 | |
| 418,076.35 | | ඉන්ධන | 858,185.11 | |
| 75,459.43 | | දැන්වීම් | 63,628.00 | |
| 190,306.81 | | ලිපිද්‍රව්‍ය | 329,673.43 | |
| 26,680.60 | | තැපැල් ගාස්තු | 46,818.25 | |
| 104,265.50 | | සංග්‍රහ | 128,733.62 | |
| 32,586.50 | | ගෘහ සාධනය | 33,828.20 | |
| 160,203.79 | | දුරකථන | 122,918.25 | |
| 61,172.93 | | විදේශීය ගමන් | 10,045.80 | |
| 237,856.56 | | විවිධ | 758,406.28 | |
| 845,342.81 | | මෝටර්රථවාහන හා වෙනත් වාහන නඩත්තුව | 1,805,508.49 | |
| 2,599.50 | | නිල ඇඳුම් | 391.90 | |
| 10,000.00 | | විගණන ගාස්තු | 15,000.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| -- | 7,528,089.39 | | බොල් ණය | 1,020.00 | 10,806,877.69 | |
| | | | ආයතන වියදම් | | | |
| 507,831.89 | | | විදුලිබලය | 538,755.81 | | |
| 34,465.95 | 1, | | ගෑස් | 46,235.89 | | |
| 2,996.00 | | | ආරක්ෂිත උපකරණ | 49,900.00 | | |
| 1,289,381.08 | 1,834,674.92 | 9,362,764.31 | ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන | 1,638,714.59 | 2,273,606.29 | 13,080,483.9 |
| | | (1,974,832.20) | ආදායමට වැඩියෙන් වියදම් පසුගියවර්ෂයසඳහා | | | (4,538,360.5 |
| | | --- | හරි ගැස්සීම | | | 110,123.3 |
| | | (1,974,832.20) | | | | (4,428,237.2 |

අත්සන් කලේ/
(ආචාර්ය හිරාන් ඩබ්ලිව්.ජයවර්ධන)
සභාපති
1987 මැයි 29

අත්සන් කලේ/
(ආචාර්ය පී.සී.එන්.ජයසූරිය)
අධ්‍යක්ෂ ජනරාල්
1987 මැයි 29